**<u>අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, බස්නාහිර පළාත</u>**

**<u>පාරම්පරික චිත්‍ර / මූර්ති පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීම - 2023</u>**

බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන දායකත්වයෙන් හොරණ කලාකේත සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්වීමට අපේක්ෂිත පාරම්පරික චිත්‍ර/මූර්ති පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාව පිළිබඳ විස්තර**

1. තුන් අවුරුදු පාඨමාලාවක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන මෙම පාඨමාලාව සතියේ වැඩ කරන දින පහේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වේ. (නේවාසික පහසුකම් සපයනු නොලැබේ.)
2. නොමිලේ පවත්වනු ලබන මෙම පාඨමාලාව සඳහා දිරි දීමනාවක් හිමි නොවන අතර, අවශ්‍ය මූලික අමු ද්‍රව්‍ය හා උපකරණ ඔබ විසින් සපයාගත යුතුවේ.
3. වසර 02 ½ න්‍යායාත්මක පාඨමාලා කාලය අවසන් කරනු ලබන සියලු පාඨමාලාභීන් මාස 06ක කාලයක් සුදුසුකම්ලත් ගුරුවරයෙකු යටතේ විහාරස්ථාන, දේවස්ථානවල සිතුවම්කරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් සඳහා යොදවනු ලබයි.
4. පාඨමාලාව සාර්ථකව අවසන් කරන සිසුන් සඳහා බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය මගින් පිරිනමනු ලබන පිළිගත් සහතිකයක් පිරිනැමේ.

**මූලික සුදුසුකම්**

1. අයදුම්කරුවන් වයස අවු. 16-30 අතර වයසේ පසුවන්නන් වීම.
2. බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් වීම.

**අධ්‍යාපන සුදුසුකම්**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් චිත්‍ර විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

   හෝ

2. චිත්‍ර ඇඳීමට ඇති සහජ හැකියාව

ඉහත සුදුසුකම් සැපිරූ ඔබ, මේ සමග ඇති අයදුම්පත සම්පූර්ණ කර, ලියාපදිංචි තැපැල මගින් <u>බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, 2 වන මහළ, අංක **204**, නව පළාත් සභා ගොඩනැගිල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල</u> යන ලිපිනයට යොමු කළ යුතුය. **<u>අයදුම්පත් යොමු කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පාරම්පරික චිත්‍ර/මූර්ති පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම යනුවෙන් සඳහන් කළ යුතුය.</u>**

ඉදිරිපත් වූ අයදුම්පත් අතරින් ඉහත සුදුසුකම් සපුරා ඇති සිසුන් සඳහා අප විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයක් සඳහා පෙනී සිටිමට සිදුවන අතර, එයින් තෝරා ගනු ලබන සිසුන් පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ. අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය : 2023.03.22

වැඩිදුර විමසීම : සංස්කෘතික නිලධාරී, අයේෂා කරුණාසේන මිය - 071-9694944
පාරම්පරික චිත්‍ර/මූර්ති ශිල්පීන්ගේ ආයතනය, අයි.ජී. චන්ද්‍රිකා මිය - 071-6358016

**සිරිසෝම ලොකුවිතාන**
ලේකම්
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

# පාරම්පරික චිත්‍ර හා මූර්ති නිර්මාණකරණය පිළිබඳ පාඨමාලාව - 2023

## ආදර්ශ අයදුම් පත්‍රය

01. සම්පූර්ණ නම (සිංහලෙන්) :-..............................................................................................

02. මුලකුරු සමඟ නම (සිංහලෙන්) :-..............................................................................................

03. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :-..............................................................................................

04. ස්ථිර තැපැල් ලිපිනය :-..............................................................................................

05. දිස්ත්‍රික්කය :-.............................. ප්‍රාලේ.කොට්ඨාසය..................................

06. උපන් දිනය :-..............................................................................................

07. හැඳුනුම්පත් අංකය :-..............................................................................................

08. 2023.03.22 දිනට වයස :- අවු..................මාස..................දින................

(උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ හැඳුනුම්පතෙහි පිටපතක් අමුණා එවිය යුතුය)

09. ස්ත්‍රී/පුරුෂ භාවය :-..............................................................................................

10. අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. (සා/පෙළ) :-..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

11. වෙනත් සුදුසුකම් සුදුසුකම් :-..............................................................................................

..............................................................................................

..............................................................................................

12. පළපුරුද්ද :-..............................................................................................

..............................................................................................

..............................................................................................

13. විද්‍යුත් තැපැල් ලිපිනය :-..............................................................................................

14. දුරකථන අංකය :-.....................................................................................

15. වට්සැප් අංකය :-.....................................................................................

ඉහත සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මා විසින් සහතික කර සිටිමි.

දිනය :....................... ....................................

අයදුම්කරුගේ අත්සන

**<u>පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය :</u>**

ඉහත නම සඳහන් .......................................................... ............................................. යන අය ................................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................................. ග්‍රාම නිලධාරී වසමේ ස්ථිර පදිංචි අයෙකු බව සහතික කරමි.

අත්සන හා නිල මුද්‍රාව : ...................................

දිනය :...................................

---

**<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>**

අයදුම්කරුගේ තොරතුරු මත පදනම්ව පාඨමාලාව සඳහා තෝරා ගතිමි / නොගතිමි.

නිර්දේශ කරන්නාගේ අත්සන : ...................................

දිනය : ...................................